ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2004 අංක 3 දරන ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**2004 ජනවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2004 අංක 3 දරන ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 06 වන දින]

එල්. ඩී- ඕ. 55/2002

**ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : **පූර්විකාව.**

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2004 අංක 3 දරන ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇස්. ඩී. බණ්ඩාරනායක පදනමේ දැනට සාමාජිකයන්ව සිටින්නාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. **ඇස්. ඩී. බණ්ඩාරනායක පදනම සංස්ථාගත කිරීම.**

2—H 015301—4,500 (2002/04)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) මූලික අධ්‍යාපනයක් නොමැති දුප්පත් මෙන්ම තරුණ ළමුන් සඳහා අධ්‍යාපනික කටයුතු සහ පෙර පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම ;

(ආ) බෞද්ධ මූලධර්ම සහ සහජීවනය පදනම් කරගෙන ලෝක සාමය ඇති කිරීම උදෙසා ජාතියට නායකභාවය දීම සහ එමගින් බුද්ධි වර්ධනය ඇති කිරීම ;

(ඇ) පොදු ජන සුභසාධනයට තරුණ ශ්‍රමය පුහුණු කිරීම ;

(ඈ) ගොවීන් දිරි ගැන්වීම සහ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම ;

(ඉ) ප්‍රාග් වෘත්තීය අධ්‍යාපන පුහුණු හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව කෙරෙහි තරුණ කොටස්වල විශේෂ අවධානය යොමු කිරීම ;

(ඊ) සම්මන්ත්‍රණ, දේශන සහ ප්‍රදර්ශන හා අධ්‍යාපනික සංචාර සංවිධානය කිරීම ;

(උ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඌ) පරම්පරාගත සිංහල වෙදකමේ යෙදී සිටින තැනැත්තන් හා බෙහෙත් පැලෑටි ආරක්ෂා කිරීම ;

(එ) පදනමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික වන හෝ වියහැකි වෙනත් ක්‍රියා, කරුණු සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන හා පරිත්‍යාග භාර ගැනීමේ හා එකතු කිරීමේ සහ පොලී ආදිය ගෙවීමේ ද, සංස්ථාවේ අරමුදල වැඩි කිරීමේ

පරමාර්ථයෙන් ස්වකීය අරමුදල් ස්වදේශීය සහ විදේශීය ආයෝජනයන්හි මුදල් යෙදවීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, කාරණා ඉටු කිරීමේ හා දේවල් ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු විධායක සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික උප භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හය දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ විධායක කාරක සභාව විසින්, (මෙහි මින්මතු "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ, කාරක සභාවේ ධුර දරමින් සිටි තැනැත්තන්ගෙන් සංස්ථාවේ පළමුවන කාරක සභාව සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා සෑදිය නීත්‍යානුකූල විය යුතු ය :–

(අ) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, සාමාජිකත්වය වර්ග කිරීම, ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන්ගේ ධුරයෙන් ඉවත් කිරීම, නිලධරයන්ගේ පාරිශ්‍රමික සහ ඔවුන්ගේ බලතල චර්යාව සහ කාර්ය ;

(ඇ) කාරක සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එහි බලතල, චර්යාව සහ කාර්යයන් සහ කාරක සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය, සහ කර්තව්‍ය ;

(ඉ) කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාවෙන් සාදන ලද රීති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී සහ එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ බල පැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ ඊට අය විය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල්, පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, බූදල් පිළිබඳ නියාදනයකින් හෝ අන් ලෙසකින් සංස්ථාව සතු වන කවර වුව ද චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා

දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශක්‍යතාව තිබිය යුතු අතර, එබඳු සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

**9.** සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ විධිවිධානවලට අනුව තෝරා පත් කර ගත් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.